# 11. දේශීය නර්තන සම්ප්‍රදායන්

# 11. දේශීය නර්තන සම්ප්‍රදායන්

1. උඩරට නර්තන සම්ප්‍රදාය
2. පහතරට නර්තන සම්ප්‍රදාය
3. සබරගමු නර්තන සම්ප්‍රදාය

# 1. උඩරට නර්තන සම්ප්‍රදාය

උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය කොහොඩා කංකාරියයි. මෙම නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සත්කෝරලය, සතර කෝරලය, මහනුවර, කුරුණෑගල, මාතලේ ආදී ප්‍රදේශ හැඳින්විය හැකිය.

මෙහි ඇඳුම් කට්ටලය වෙස් ඇඳුම් කට්ටලයයි. උඩරට නැටුම් සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැට බෙරයයි. ගැට බෙරයේ දිග වියත් තුනයි අඟල් තුනයි. ඇහැළ, කොහොඹ, වරකා වැනි දැව වර්ග කඳ සඳහා යොදා ගන්නා අතර හරක් හම්, වඳුරු හම් හෝ තලගොයි හමින් දෙපස නිම කෙරෙයි.

ගැටබෙරය



# 2. පහතරට නර්තන සම්ප්‍රදාය

ශාන්ති කර්ම පදනම් කරගෙන බිහි වී ඇති පහත රට නර්තන සම්ප්‍රදායේ ඇදහිලි විශ්වාස ලෙස බෞද්ධ, දේව, යක්ෂ, භූත සංකල්ප හැඳින්විය හැකය. මෙම නර්තන සම්ප්‍රදාය බිහිවීමේ ප්‍රධාන හේතුව ලෙස සේරමාන් රජුගේ හිසේ රුදාව පිළිබඳ පුරාවෘත්තිය ගත හැකය.

ප්‍රචලිත ප්‍රදේශ ලෙස කළුතර, ගාල්ල, මාතර, බෙන්තර, හම්බන්තොට, දෙවිනුවර, අම්බලන්ගොඩ සඳහන් කළ හැකිය. තෙල්මෙ, දෙවොල් වැනි ඇඳුම් කට්ටල ප්‍රධාන තැනක් ගනී.

ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වනුයේ පහත රට බෙරයයි. දෙවොල් බෙරය, සෝෂක බෙරය, දික් බෙරය යන නම් වලින් හඳුන්වන්නේද මෙයයි. කිතුල්, කොස්, පොල්, ඇහැළ ආදී දැව වර්ග භාවිතා කරයි. බෙරයෙහි දෙපැත්තට හරක් බොක්ක (සිවිය) හම් භාවිතා කරයි.

පහතරට බෙරය



# 3. සබරගමු නර්තන සම්ප්‍රදාය

සබරගමු නර්තන සම්ප්‍රදාය සපරු හෙවත් වැදි ගෝත්‍රයේ අය වැඩි වශයෙන් ජීවත් වූ ප්‍රදේශය නිසා සබරගමු ප්‍රදේශය නම් විය. මෙයද ශාන්ති කර්ම පදනම් කරගෙන බිහි වී ඇත. ප්‍රධාන ශාන්ති කර්මය පහන් මඩුවයි. ප්‍රධාන ඇඳුම් කට්ටලය සබරගමු ඇඳුම් කට්ටලයයි. රත්නපුරය, පැල්මඩුල්ල ප්‍රචලිත ප්‍රදේශ වේ. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුල වේ.

දවුල

